**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2021**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 | | |
| (i) 34 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ වසර 05කට වරක් ප්‍රත්‍යාගණනය කිරීමක් සිදු කළයුතු වුවත්, මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන දේපල පිරියත හා උපකරණවල වටිනාකම 2013 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණු බැවින්, දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්නුම් කර නොතිබුණි. | වටිනාකමේ ප්‍රමාණාත්මකභාවය සැලකිල්ලට ගෙන සාපේක්ෂ වටිනාකම් සැලකිය යුතු අගයක් ගන්නා මෝටර් රථ වල පමණක් 2022 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී . අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන අතර වාර්ෂික වත්කම් සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම මගින් එකී වර්ෂය තුල භෞතික පැවැත්ම තහවුරු කිරීම සිදුවේ . | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ii) 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.42,139,250ක් වූ මෝටර් රථ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් | වටිනාකමේ ප්‍රමාණාත්මකභාවය සැලකිල්ලට ගෙන සාපේක්ෂ වටිනාකම් සැලකිය යුතු අගයක් ගන්නා මෝටර් රථ වල පමණක් 2022 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන අතර වාර්ෂික වත්කම් සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම මගින් එකී වර්ෂය තුල භෞතික පැවැත්ම තහවුරු කිරීම සිදුවේ . | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අංක 19 ට අනුව ගෙවිය යුතු පාරිතෝෂිත ප්‍රතිපාදන ගණනයේදී නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය පෙන්නුම් කල යුතු අතර ඒ සඳහා සියළු ආයු ගණක ලාභයන් සහ අලාභයන් විස්තීරණ ආදායම් ප්‍රකාශයේදී සලකා බැලිය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.9,196,815 ක පාරිතෝෂිත දීමනා සඳහා වෙන් කිරීමේදී, ඊට අනුරූපව ගණනය කිරීම් සිදු කර නොතිබුණි. | 2022 වසරෙහි සිට ගිණුම් පිළියෙල කිරීමේ දී පාරිතෝෂික ප්‍රතිපාදන ගණනයේ දී ආයු ගණක ලාභ අලාභය ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් විශේෂඥ සහාය ලබා ගනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලය විසින් අපනයනකරුවන් සඳහා ලබාදුන් ණය ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 38,805,509 ක් වී තිබුණු අතර ඉන් රු. 37,609,509 ක් වර්ෂ 23 ක්ද, රු. 1,196,000 ක් වර්ෂ 15 ක්ද පැරණි ණය ශේෂයන් විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මණ්ඩලයට එම ණය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අපනයනකරුවන් සඳහා ලබා දී මෙතෙක් නොගෙවන ලද ණය ශේෂයන් නැවත අය කර ගැනීම පිළිබඳ සොයා බලා කටයුතු කිරීම සඳහා විගණන කමිටුවේ උපදෙස්මත නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් 2021 දෙසැම්බර් මස 02 වන දින පත් කර තිබුණු අතර,පිළිවෙලින් 2021 වර්ෂය තුල රු. 408,000ක් සහ 2022 අප්‍රේල් 25 වන දින විට රු. 471,500ක් වශයෙන් ණය ආපසු අයකර ගෙන තිබුණි. | අයකර ගත නොහැකි ණය ශේෂ නිශ්චිතවම හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ආ)ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන (UPEPV) සමාගම වෙත ලබාදී තිබුණු රු.10,403,683 ක් 2009 වර්ෂයේ සිට දිගින් දිගටම වර්ෂ 12 ක කාලයක් ගිණුම්වල පැවතුණු අතර එම මුදල හෝ ඉන් කොටසක් හෝ මණ්ඩලය වෙත | වර්තමානයේ ඌව පරණගම නිෂ්පාදන ගම්මාන වැඩසටහන අක්‍රිය තත්ත්වයක පවතියි. කෙසේ නමුත් එයට අදාල තොරතුරු වල පවතින අඩුපාඩු හේතුවෙන් කිසිදු මුදලක් මේ වන විට අය කර ගැනීමට අපොහොසත් වී ඇති අතර ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන සමාගම සමග කටයුතු කර අවශ්‍ය විස්තර ලබා ගෙන විගණන කමිටුවේ | මෙම මුදල් අයකර ගැනීම සඳහා විගණන කමිටුවේ නිර්දේශ හා උපදේශකත්වය මත සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | |
|---|---|
| නැවත අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | උපදේශකත්වය මත සුදුසු ක්‍රියාමාර්ග වලට එලඹීමට කටයුතු කරනු ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 212,526,203 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.74,011,899 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.138,514,304ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආශ්‍රිත සමාගමේ කර තිබූ ආයෝජනයෙන් ලද ලාභය රු.52,639,028කින් හා භාණ්ඩාගාර ප්‍රදාන රු.122,655,109කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලය විසින් 2021 දෙසැම්බර් 31 දිනට රු.g56,332,354 ක මුදලක් සමාගම් 34 ක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබුණු අතර ඉන් රු.36,271,994ක ආයෝජිත වටිනාකමක් සහිත සමාගම් 23ක් පමණක් 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී තත්වයේ පැවතුණි. එසේම ක්‍රියාකාරී තත්වයේ පැවති සමාගම් 23න් සමාගම් 02කින් පමණක් සමාලෝචිත වර්ෂයේදී ලාභාංශ ලෙස රු.40,345,573ක් ලැබී තිබුණි. | ක්‍රියාකාරී තත්වයේ පවතින සමාගම් අතරින් බොහොමයක් අලාභ පිට පවත්වාගෙන යන ඒවා වීම නිසා ලාභාංශ ප්‍රකාශ කර නොමැත. කෙසේ නමුත් මෙම සමාගම් වලින් මණ්ඩලය වෙත හිමි විය යුතු ප්‍රතිලාභ පිළිබඳ සොයා බලා කටයුතු කිරීමට මණ්ඩලයේ නියෝජිතයන් අදාළ සමාගම් වෙත නම් කිරීමට පියවර ගන්නා අතර DHPL ආයතනයට අමතරව මණ්ඩලයේ නිළධාරීන් අනෙකුත් සමාගම් හතරක අධ්‍යක්ෂ මණ්ඩලයට දැනටමත් පත් කර ඇත. එසේ අධ්‍යක්ෂ මණ්ඩලයට නියෝජිතයන් පත් කිරීමට අවකාශ නොමැති සමාගම් පිළිබඳ සොයාබලා මණ්ඩලය වෙත ලැබිය යුතු ප්‍රතිලාභ මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කිරීමට නිලධාරීන් වෙත පැවරීමටත් කටයුතු කරමින් පවතී. | මණ්ඩලය විසින් සිදුකරනු ලැබූ ආයෝජන වලින් ලැබිය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ)මණ්ඩලය විසින් 2021 දෙසැම්බර් 31 දිනට රු.105,117,478ක මුදලක් සමාගම් 29 ක නිදහස් කළ හැකි වරණීය කොටස්වල ආයෝජනය කර තිබුණු අතර ඉන් රු.81,877,780ක ආයෝජිත වටිනාකමක් සහිත සමාගම් 16ක් පමණක් 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී තත්වයේ පැවතුණි. එසේ වුවද ක්‍රියාකාරී තත්වයේ පැවති සමාගම්වල ආයෝජන මතද කිසිදු ලාභාංශයක් සමාලෝචිත වර්ෂය තුල ලැබී නොතිබුණි. | මෙම සමාගම් අතරින් ලාභ උපයන ක්‍රියාකාරී තත්වයේ පවතින සමාගම් වල මූල්‍ය සහ මෙහෙයුම් තත්ත්වය පිළිබඳ සොයා බලා ඉදිරියේ දී ලාභාංශ ආදායම් මණ්ඩලය වෙත ලබා ගැනීමට ඇති හැකියාව සොයා බලා කටයුතු කරමින් පවතී. | මණ්ඩලය විසින් සිදුකරනු ලැබූ ආයෝජන වලින් ලැබිය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් කුලී පදනම මත ලබාගත් DHPL ආයතනයේ ගොඩනැගිල්ලෙහි ,5 ,6 ,7 8සහ 9යන මහල් පහ භාවිතයට ගෙන තිබුණු අතර එහි මුළු බිම් ප්‍රමාණය වර්ග අඩි 14,097ක් විය. ගොඩනැගිල්ලේ භාවිතය සහ කුලී ගෙවීම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i)ගොඩනැගිල්ලේ 09 වන මහළට අයත් වර්ග අඩි 120.96 ක් සහ වර්ග අඩි 178.25 ක් පෞද්ගලික ආයතන 02 ක් වෙත කුලී අය කිරීමකින් තොරව පරිහරණය සඳහා ලබාදීමට ගිවිසුම්ගත වී තිබුණු අතර, එම ගිවිසුම්ගත කාලය අවසන් වීමෙන් පසු 2019 දෙසැම්බර් 10 දින සිට ප්‍රයෝජනවත් කාර්යයකට යෙදීමෙන් තොරව එම කුටි නිෂ්කාර්යව පැවතුණි. | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 12 (1) යටතේ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ලංකා රබර් ග්ලෝබල් කොන්සෝටියම් (පෞද්) සමාගම සහ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) වෙත ඔවුන්ගේ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා මණ්ඩලයේ කළමණාකාරීත්වයේ අනුමැතිය මත කෙටි කාලසීමාවක් සඳහා ඉඩ පහසුකම් ලබාදෙන ලදී.<br>පසුගිය වසර දෙක තුළ පැවති කෝවිඩ් වසංගතය, රට අගුලු දැමීම් සහ ඇඳිරි නීතිය හේතුවෙන් උක්ත සමාගම්වලට ඔවුන්ගේ කටයුතු අපනයන සංවර්ධන මණ්ඩල පරිශ්‍රයේ සිට කරගෙන යාමට නොහැකි විය. | කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල නිසි පරිදි උපයෝජනය කරගත යුතු වේ. |
| (ii) මණ්ඩලයේ අධීක්ෂණ කාර්යයන් සිදුකිරීම සඳහා 09 වන මහලෙහි වර්ග අඩි 389.4ක ප්‍රමාණයක්ද, මණ්ඩලයේ අපනයන සේවා අංශය හා වෙළඳ පොළ සංවර්ධන අංශය ස්ථාපිත කිරීම සඳහා 08වන මහලෙහි වර්ග අඩි 508.75ක්ද වෙන්කර තිබූ නමුත් එම ඉඩකඩ සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර නොතිබුණි. | 09 වන මහලෙහි වර්ග අඩි 389.4ක ප්‍රමාණයෙහි කාර්යසාධන අධීක්ෂණ ඒකකය 2017 වසරේදී ස්ථාපනය කල අතර මණ්ඩලය තුල 2020.12.31 වන විට සේවක පුරප්පාඩු 60 ක් තිබූ අතර අධීක්ෂණ ඒකකයෙහි සිටි නිලධාරීන් තාවකාලිකව ප්‍රතිපත්ති හා සැලසුම් අංශය වෙත අනුයුක්ත කරන ලදී. ඉදිරියේදී මණ්ඩලයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවූ විට නැවත එම ස්ථානය ප්‍රයෝජනයට ගත යුතුව ඇත.<br>08 වන මහලෙහි වර්ග අඩි 508.75ක ඉඩ ප්‍රමාණය, ඉදිරියේදී අභ්‍යන්තර විගණන ඒකකය හෝ රත්මලාන ස්ථාපනය කර ඇති ලේඛන ගබඩාව ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. | කුලී ගෙවනු ලබන ගොඩනැගිල්ල නිසි පරිදි උපයෝජනය කරගත යුතු වේ. |

| | | |
|---|---|---|
| (iii) ඒ අනුව ගොඩනැගිල්ලේ මුළු බිම් ප්‍රමාණයෙන් වර්ග අඩි 1,197.61 ක් උපයෝජනය කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවති අතර, සමාලෝචිත වර්ෂය තුලදී මණ්ඩලය විසින් වර්ග අඩියක් වෙනුවෙන් රු. 5,282 ක කුලී මුදලක් ගෙවා තිබුණෙන් නිෂ්කාර්යව පැවති ඉඩකඩ වෙනුවෙන් රු. 6,325,776 ක පිරිවැයක් දරා තිබුණි. | සේවක මණ්ඩල පුරප්පාඩු පිරවූ පසුව අපනයන සංවර්ධන මණ්ඩලය සතු බුද්ධිමය දේපල අයිතීන් හා සන්නානමයන් භාවිතා කිරීමට අපනයනකරුවන්ට බලපත්‍රලබාදීමට, ඒවා නියාමනය කිරීම සඳහා වෙනම ඒකකයක් පිහිටුවීමට හා ශ්‍රී ලංකාවට තවදුරටත් ලබාගත හැකි භූගෝලීය දර්ශක අයිතීන් පිළිබඳ අධ්‍යනය කිරීමට මෙන්ම වෙළෙඳපල පර්යේෂණ කටයුතු සඳහා නව අංශ පිහිටුවීමට මෙම ඉඩකඩ ඉදිරියේ දී භාවිතා කිරීමට නියමිතය. | කුලී ගෙවනු ලබන ගොඩනැගිල්ල නිසි පරිදි උපයෝජනය කරගත යුතු වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 263 ක් වුවත් තථ්‍ය කාර්ය මණ්ඩලය 196 ක් වූයෙන් තනතුරු 67 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 20 ක්ද, තෘතීය මට්ටමේ තනතුරු 10 ක්ද, ද්විතීය මට්ටමේ තනතුරු 21ක්ද සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක්ද විය.<br>මණ්ඩලයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට ඍජුවම අදාල වන අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (මානව සම්පත්), අධ්‍යක්ෂ (මූල්‍ය), අධ්‍යක්ෂ (වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු) සහ අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) වැනි ප්‍රධාන තනතුරු 05ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂය තුලදීත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | මණ්ඩලයට අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |